# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

**(129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් 2024 ජනවාරි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 නොවැම්බර් මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[235 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වයස අවුරුදු දහ අටට එළඹ ඇති යම් කාන්තාවක් යම් දිනයක පෙ.ව. 6.00 ට පෙර හෝ ප.ව. 6.00 න් පසුව තොරතුරු තාක්ෂණය සහ දැනුම් ක්‍රියාවලිය පිටතින් ලබා ගැනීම මත පදනම් වූ ව්‍යාපාරයක යෙදී සිටින ආයතනයක හෝ ව්‍යාපාර ක්‍රියාවලිය පිටතින් ලබා ගැනීමේ ආයතනයක හෝ විදේශයක පිහිටා ඇති යම් ආයතනයක් වෙනුවෙන් ගිණුම් හා පරිපාලන කටයුතුවල හෝ පසු පෙළ කාර්යාලයක ඒ හා ආශ්‍රිත වැඩකටයුතුවල යෙදී සිටින යම් ආයතනයක සේවයේ නියුක්ත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප.ව. 10.00 න් පසුව සහ පෙ.ව. 6.00ට පෙරාතුව එවැනි කාන්තා සේවා නියුක්තිකයකු සේවයේ යොදවනු ලබන සේවායෝජකයකු විසින් අනුගමනය කරනු ලැබිය යුතු එවැනි සේවා නියුක්තිකයකුගේ ආරක්ෂාව, ප්‍රවාහන පහසුකම් සහ ඔවුන් විවේක ගැන්වීමේ පහසුකම් ඇතුළු එවැනි කාන්තා සේවා නියුක්තිකයන්ගේ සුබසාධනයට අදාළ නියම හා කොන්දේසි නිශ්චිතව දක්වමින් නියෝග සෑදීම සඳහා අමාත්‍යවරයාට හැකියාව ලැබෙන පරිදි විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් "කාර්යාලය" යන යෙදුමේ අර්ථ නිරූපණය පුළුල් කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 2 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

## සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

එල්.ඩී.-ඕ. 27/2022

### (129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2024 අංක          දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**129 වන අධිකාරයේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම**

**2.** (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "සම්බන්ධයෙන් සේවයෙහි නියුක්ත කරවනු ලැබිය හැකි ය. තව ද" යන වචන වෙනුවට "සම්බන්ධයෙන් සේවයෙහි නියුක්ත කරනු ලැබිය හැකි ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනුඡේදයේ "සේවයෙහි නියුක්ත කරනු ලැබිය හැකි ය;" යන වචන වෙනුවට "සේවයෙහි නියුක්ත කරනු ලැබිය හැකි ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(V) වයස අවුරුදු දහ අටට එළඹ ඇති යම් කාන්තාවක් යම් දිනයක පෙ.ව. 6.00 ට පෙර හෝ ප.ව. 6.00 න් පසුව තොරතුරු තාක්ෂණය සහ දැනුම් ක්‍රියාවලිය පිටතින් ලබාගැනීම මත පදනම් වූ ව්‍යාපාරයක යෙදී සිටින ආයතනයක

හෝ ව්‍යාපාර ක්‍රියාවලිය පිටතින් ලබාගැනීමේ ආයතනයක හෝ විදේශයක පිහිටා ඇති යම් ආයතනයක් වෙනුවෙන් ගිණුම් හා පරිපාලන කටයුතුවල හෝ පසු පෙළ කාර්යාලයක ඒ හා ආශ්‍රිත වැඩකටයුතුවල යෙදී සිටින යම් ආයතනයක සේවයේ නියුක්ත කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඊඅ) යම් සේවායෝජකයකු විසින් යම් කාන්තාවන් ප.ව.10.00 න් පසුව සහ පෙ.ව. 6.00 ට පෙරාතුව වූ කාලසීමාව තුළ දී සේවයේ නියුක්ත කරන ලබන අවස්ථාවක දී, එම කාන්තාවන්ගේ ආරක්ෂාව, ප්‍රවාහන පහසුකම් සහ විවේක ගැනීමේ පහසුකම් ඇතුළු එම කාන්තාවන්ගේ සුබසාධනයට අදාළ නියම හා කොන්දේසි එම සේවායෝජක විසින් අනුගමනය කරනු ලැබිය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "කාර්යාලය" යන යෙදුමේ අර්ථ නිරූපනයේ (අ) ඡේදයේ "කාර්යාලයක් හෝ ලිපිකරු අංශයක්; සහ" යන වචන වෙනුවට "කාර්යාලයක් හෝ ලිපිකරු අංශයක;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) ඡේදයේ "වෙනත් යම් ආයතන;" යන වචන වෙනුවට "වෙනත් යම් ආයතන; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

"(ඇ) තොරතුරු තාක්ෂණය සහ දැනුම් ක්‍රියාවලිය පිටතින් ලබා ගැනීම මත පදනම් වූ යම්

ව්‍යාපාරයක යෙදී සිටින ආයතනයක් හෝ ව්‍යාපාර ක්‍රියාවලිය පිටතින් ලබා ගැනීමේ ආයතනයක් හෝ විදේශයක පිහිටා ඇති යම් ආයතනයක් වෙනුවෙන් ගිණුම් හා පරිපාලන කටයුතුවල හෝ පසු පෙළ කාර්යාලයක ඒ හා ආශ්‍රිත කටයුතුවල යෙදී සිටින යම් ආයතනයක,

ඇතුළත් වේ.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.